# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2319/72 - 2023 පෙබරවාරි මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2023.02.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කාත්තන්කුඩි නගර සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන කාත්තන්කුඩි නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කාත්තන්කුඩි නගර සභාවේ අංක 01 බදුරියා කොට්ඨාසයට තේරී පත් වූ මුහම්මදු මුස්තෆා අබ්දුල් ලතීෆ් අයත් වන්නා වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කාත්තන්කුඩි නගර සභාවේ අංක 01 බදුරියා කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා මුහම්මදු මුස්තෆා ජෙසීමා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

කාත්තන්කුඩි නගර සභාවේ තේරීම්භාර නිලධාරි, මුහෙයියදීන් බාවා මුහම්මදු සුෆ්යාන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් මුහම්මදු මුස්තෆා ජෙසීමා, කාත්තන්කුඩි නගර සභාවේ අංක 01 බදුරියා කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**එම්. බී. එම්. සුෆ්යාන්,**
තේරීම්භාර නිලධාරි,
කාත්තන්කුඩි නගර සභාව.

2023 පෙබරවාරි මස 16 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

EOG 02-0187